# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සහ විශාලතම ක්‍රීඩා සංකීර්ණ පද්ධතිය කළමනාකරණය කරනු ලබන සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සතු මානව සහ භෞතික සම්පත් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස මෙහෙයවීම සඳහා, ඉහළ නායකත්ව හා හැකියාවන්ගෙන් පිරිපුන්, පළපුරුදු සහ දක්ෂ වෘත්තිකයින්ගෙන් පහත සඳහන් අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (HM 1-1) - පුරප්පාඩු 01

**බාහිර අයදුම්කරුවන්**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ක්‍රීඩා කළමනාකරණ / ව්‍යාපාර පරිපාලන / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / මානව සම්පත් කළමනාකරණය / වානිජ්‍ය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

**සමඟ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

කළමනාකාර සේවා (MM 1-3) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සමඟ**

බහුවිධ කාර්යයන් හි තියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමේලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීණතාවය.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය :** HM 1-1-රු: (140,640.00 15 X 4,100-202,140.00)

**වයස් සීමාව :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර, අවු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප :** කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 01/2025 හි විධිවිධානයන්ට අනුව , ඉහත වැටුප් පරිමාණයන්ට ඇති හිමිකම පත්වීම් දින සිට ක්‍රියාත්මක වේ. අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන වැටුප් වැඩිවීමට අනුකූලව ,අදාළ පත්වීම් වර්ෂය සඳහා එම තනතුරට නියමිත වැටුප සමඟ රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය:**

ඉහළම සුදුසුකම් සහ ක්ෂේත්‍රයේ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයෙහි කාර්යය සාධනය මත තෝරාගනු ලැබේ.

**පත්කිරීමේ ස්වභාවය:**

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් සහිත පත්වීමකි.

**බඳවා ගැනීමේ ක්‍රම වේදය:**

මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරාලන සහ පත්කිරීම් බලධාරියා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන සුදුසුකම් ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකින් උපරිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා බඳවා ගැනීමට තෝරාගනු ලැබේ. මෙම සුදුසුකම් ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටිය අනුව ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුකූලව පවත්වනු ලැබේ.

**පොදු අවශ්‍යතා සහ කොන්දේසි**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වියයුතුය.
- දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා අයදුම්පත් යොමු කළයුතු වේ.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා යෝග්‍ය කායික හා මානසික තත්ත්වයක් තිබිය යුතුය.
- ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලූ ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් අයදුම්පත්‍රය හා සියලුම අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත් තමා විසින්ම සහතික කර 2026.07.13 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මඟින් එවිය යුතුය. අදාළ අයදුම්පත්‍රයේ ආකෘතිය සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ නිල වෙබ් අඩවිය වන https://snsca.gov.lk වෙතින් බාගත කර ගත හැක. අවසන් දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,**
**තැ පෙ. 2211, ආතර් ද සිල්වා මාවත,**
**කොළඹ 13.**
**දුරකථන අංක : 011 2445677 / 011 2384385**